# කුරුල්ලන්ගල ප්‍රාථමික පර්වත සිතුවම් පිළිබඳව මූලික අධ්‍යයනයක්


<u>ගම්පොළ විජයහිමි</u>[1], ආර්. ඩී. ඒ. ශාන්ත

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
[1]gampolavijayathero@gmail.com


---


කුරුල්ලන්ගල, ප්‍රාථමික සිතුවම් සහිත අප්‍රකට පුරාවිද්‍යා ක්ෂේත්‍රයකි. ළඟාවීමේ පවතින දුෂ්කරතාවන් හේතුවෙන් මෙම ස්ථානය නරඹන්නන්ගෙන් ව්‍යුක්තව පවතියි. ඉකුත් දශකය තුළ පර්යේෂණ කණ්ඩායම් කිහිපයක් මෙම ස්ථානය නිරීක්ෂණය කරන ලද බව කියවෙතත් සිතුවම් පිළිබඳව මූලික වාර්තාකරණයක් හෝ සිදුව ඇති බව නොපෙනේ. තව ද, ඇතැම් ඓතිහාසික ප්‍රවාද හා බැඳි ඊනියා මතවාද තහවුරු කිරීමේ අරමුණින් පුරා සාධක ගවේෂණය කරන්නන් ද මෙම සිතුවම් පිළිබඳ අර්ථකථනයන් සැපයීමට ඉදිරිපත් වීම නිසා ඒවායෙහි විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් වුව ද ගැටලු පැන නැඟී තිබේ. එබැවින් මෙම සිතුවම් පිළිබඳව විධිමත් වාර්තාකරණයක් සිදුකිරීම හා එහි සන්දර්භමය වැදගත්කම අවධාරණය කරගැනීම කාලීන අවශ්‍යතාවයක්ව ඇති අතර මෙම අධ්‍යයනයෙන් එකී කාර්යය අරමුණු කෙරිණි.

ඒ සඳහා ප්‍රධාන පර්යේෂකයා ඇතුළු පර්යේෂණ කණ්ඩායම 2014 මැද භාගයේ සිතුවම් සහිත ස්ථානය මෙන් ම ආංශුක කලාපය ද නිරීක්ෂණය කර ඡායාරූප, පරිමාණගත දළ සටහන් හා අදාළ විස්තර ලේඛනගත කිරීම මඟින් වාර්තා කිරීම සිදු කරනු ලැබිණි. සිතුවම් පිළිබඳව දත්ත විශ්ලේෂණයේ දී වස්තුවිෂයය, නිරූපිත ස්වරූපය, ස්ථානගත වීම, ශෛලිය හා භාවිත මාධ්‍ය වැනි සාධක සම්බන්ධයෙන් මූලිකව සලකා බැලිණි. ඒ අනුව යථෝක්ත සිතුවම්වල සමානත්වයන් මෙන් ම විවිධත්වයන් රැසක් පෙන්නුම් කෙරෙන අතර දැනටත් මිහිපිට ජීවත්වන, ඇතම් විට ජීවත් ව වඳ වී ගිය කුරුලු විශේෂ හා තවත් සත්ත්ව රූප කිහිපයක් සිතුවම් සඳහා වස්තුවිෂයය වී ඇති ආකාරය හඳුනාගත හැකි විය. යථෝක්ත සිතුවම් මෙරට සෙසු ස්ථානවලින් හඳුනාගෙන ඇති ප්‍රාථමික ගුහා සිතුවම් සමඟ සංසන්දනය කිරීමේ දී පෙනී යන කරුණ නම් වස්තු විෂයය පමණක් නොව ශෛලීය වශයෙන් ද කැපී පෙනෙන විශේෂත්වයන් පවතින බව ය.

එහෙත් කුරුල්ලන්ගල සිතුවම්වලට සමාන වෙනත් සිතුවම් මෙරටින් හමු නොවූ පමණින් තත් සිතුවම්වලට හිමිවිය යුතු අවකාශීය සන්දර්භය ප්‍රතික්ෂේප කිරීම යෝග්‍ය නොවේ. කෙසේ නමුදු මෙම සිතුවම්වලට කාලනිර්ණයක් ලබා දීම වඩාත් දුෂ්කර කාර්යයකි. මෙරට බොහෝමයක් ස්ථානවලින් හමුවෙන සිතුවම්වලින් වැඩි ප්‍රමාණයක් වැද්දන් විසින් අඳින ලද සිතුවම් බව පර්යේෂකයන් කිහිප දෙනෙකුම සහේතුකව පෙන්වාදී තිබේ. මෙම සිතුවම්වල කතෘත්වය සම්බන්ධයෙන් අපගේ මතය නම් මේවා පසුකාලීනව නැතිනම් වැද්දන් විසින් අඳින ලද සිතුවම්වලට වඩා ප්‍රාග් ඓතිහාසික යුගයේ අඳින ලද සිතුවම් වීමේ වැඩි සම්භාවිතාවක් පවතින බව ය. තත් ආංශුක කලාපයෙන් මෙසොලිතික යුගයට අයත් පුරාවිද්‍යාත්මක සාධක ද හඳුනාගෙන ඇති අතර අප විසින් සිදුකළ ක්ෂේත්‍ර නිරීක්ෂණයේදී ද එබඳු නව ස්ථානයක් හඳුනාගත හැකි විය. එබැවින් සමස්තය සලකා බැලූ කළ මෙම සිතුවම් මෙසොලිතික යුගයට අයත් වීමේ ඉහළ ශක්‍යතාවක් පවතියි.


ප්‍රමුඛ පද : කුරුල්ලන්ගල, වස්තු විෂයය, කුරුලු විශේෂ, සත්ත්ව රූප